**මෙය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වෙන වෙනම පළවේ.**

# අයවැය ඇස්තමේන්තුව
# 2026

3 වන වෙළුම

මුදල් වර්ෂය - 2026

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

# 2026 ඇස්තමේන්තු

## අන්තර්ගතය


| විස්තරය | පිටු අංකය |
|---|---|
| **1. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් වියදම් ආයතන** | **V** |
| **2. 2026 අයවැය ඇස්තමේන්තු පිළිබඳව හැඳින්වීමේ සටහන** | **IX** |
| 2.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ වෙනත් නීති මගින් බලය ලැබී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු රජයේ වියදම් | XVII |
| **3. ආදායම් ඇස්තමේන්තු** | **XIX** |
| 3.1. ආදායම් වර්ගීකරණය | |
| 3.1.1. ආදායම් වර්ගීකරණය - බදු ආදායම | XXI |
| 3.1.2. ආදායම් වර්ගීකරණය - බදු නොවන ආදායම | XXII |
| 3.1.3. ආදායම් වර්ගීකරණය - පළාත් සභා ආදායම | XXIII |
| 3.2. රාජ්‍ය ආදායම | |
| 3.2.1 රාජ්‍ය ආදායම - බදු ආදායම | XXIV |
| 3.2.2. රාජ්‍ය ආදායම - බදු නොවන ආදායම | XXVI |
| 3.2.3. රාජ්‍ය ආදායම - පළාත් සභා ආදායම | XXVII |
| **4. වියදම් ඇස්තමේන්තු** | **XXIX** |
| 4.1. වියදම් වර්ගීකරණය - සම්මිත වැය විෂයයන්, වැය විෂයය කාණ්ඩ සහ විය විෂයය නාම | XXXI |
| 4.2. වැඩසටහන් අනුව වියදම් සාරාංශය | XXXIV |
| 4.3. මූල්‍යකරණ සාරාංශය | XXXV |
| 4.4. අමාත්‍යාංශ / විශේෂ වියදම් ඒකක අනුව රජයේ වියදම | XXXVI |
| 4.5. වැය විෂයයන් හා වැය විෂයය කාණ්ඩ අනුව වියදම් සාරාංශය | XLII |
| 4.6. විස්තරාත්මක වියදම් ඇස්තමේන්තු - 1 වන වෙළුම | XLVII |
| **5. අත්තිකාරම් ගිණුම් කටයුතුවල සීමාවන්** | 513 |
| **6. අත්හිටවූ වියදම් ශීර්ෂ** | 521 |

## 2026 ඇස්තමේන්තු

### 1. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් වියදම් ආයතන


| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / අනෙකුත් වියදම් ආයතන | වෙළුම | පිටු අංකය |
|---|---|---|---|
| 1 | අතිගරු ජනාධිපති | I | 8 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | I | 18 |
| 4 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු | I | 23 |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | I | 26 |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | I | 30 |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | I | 34 |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | I | 37 |
| 9 | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය | I | 41 |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව | I | 45 |
| 11 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | I | 47 |
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | I | 51 |
| 16 | පාර්ලිමේන්තුව | I | 55 |
| 17 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | I | 61 |
| 18 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය | I | 63 |
| 19 | පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය | I | 65 |
| 20 | මැතිවරණ කොමිෂන් සභාව | I | 69 |
| 21 | ජාතික විගණන කාර්යාලය | I | 73 |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය | I | 77 |
| 23 | විගණන සේවා කොමිෂන් සභාව | I | 79 |
| 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | I | 83 |
| 25 | සීමා නිර්ණය කොමිෂන් සභාව | I | 87 |
| 101 | බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | I | 91 |
| 102 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | I | 161 |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | I | 281 |
| 110 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | I | 335 |
| 111 | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | II | 1 |
| 112 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | II | 75 |
| 116 | වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය | II | 97 |
| 117 | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | II | 133 |
| 118 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය | II | 193 |
| 119 | බලශක්ති අමාත්‍යාංශය | II | 285 |
| 123 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | II | 303 |
| 124 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | II | 347 |
| 126 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | II | 381 |
| 130 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා | III | 1 |
| 135 | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | III | 205 |
| 149 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | III | 235 |
| 151 | ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය | III | 267 |
| 160 | පරිසර අමාත්‍යාංශය | III | 289 |
| 171 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | III | 333 |
| 176 | වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | III | 357 |
| 186 | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | III | 375 |
| 189 | මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | III | 395 |
| 193 | කම්කරු අමාත්‍යාංශය | III | 425 |
| 194 | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය | III | 459 |
| 196 | විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය | III | 491 |

| | | | |
|---|---|---|---|
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | I | 110 |
| 202 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | I | 116 |
| 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | I | 120 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්මේන්තුව | I | 124 |
| 205 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | I | 128 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | I | 132 |
| 207 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | I | 139 |
| 208 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | I | 145 |
| 209 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | I | 152 |
| 210 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | II | 44 |
| 211 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | II | 51 |
| 212 | විභාග දෙපාර්තමේන්තුව | II | 423 |
| 213 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | II | 428 |
| 214 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | II | 432 |
| 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | II | 438 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | II | 365 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | III | 351 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | III | 482 |
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | II | 56 |
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව | III | 443 |
| 222 | ශ්‍රී ලංකා යුද හමුදාව | I | 310 |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | I | 314 |
| 224 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | I | 319 |
| 225 | ශ්‍රී ලංකා පොලීසිය | III | 411 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | III | 415 |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | III | 389 |
| 228 | අධිකරණ පරිපාලනය | I | 358 |
| 229 | නීතිපති දෙපාර්තමේන්තුව | I | 365 |
| 230 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | I | 369 |
| 231 | ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | I | 373 |
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | I | 375 |
| 233 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | I | 379 |
| 234 | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් | I | 383 |
| 235 | ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව | I | 388 |
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | I | 391 |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | I | 181 |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | I | 187 |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | I | 189 |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | I | 193 |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | I | 201 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | I | 306 |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | I | 210 |
| 244 | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | I | 217 |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | I | 220 |
| 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | I | 224 |
| 247 | ශ්‍රී ලංකා රේගුව | I | 228 |
| 248 | සුරාබදු දෙපාර්තමේන්තුව | I | 233 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | I | 237 |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | I | 243 |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | I | 247 |
| 252 | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | I | 251 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | III | 29 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | III | 35 |
| 255 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ | III | 41 |
| 256 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | III | 46 |
| 257 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර | III | 51 |

| | | | |
|---|---|---|---|
| 258 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර | III | 56 |
| 259 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ | III | 61 |
| 260 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය | III | 66 |
| 261 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල | III | 71 |
| 262 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | III | 76 |
| 263 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | III | 81 |
| 264 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - යාපනය | III | 86 |
| 265 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - මන්නාරම | III | 91 |
| 266 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - වවුනියාව | III | 96 |
| 267 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - මුලතිව් | III | 101 |
| 268 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - කිලිනොච්චි | III | 106 |
| 269 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - මඩකලපුව | III | 111 |
| 270 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | III | 116 |
| 271 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - ත්‍රිකුණාමලය | III | 122 |
| 272 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | III | 127 |
| 273 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම | III | 133 |
| 274 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර | III | 138 |
| 275 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොළොන්නරුව | III | 143 |
| 276 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල | III | 148 |
| 277 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | III | 154 |
| 278 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර | III | 159 |
| 279 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල | III | 164 |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | I | 256 |
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | II | 224 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | II | 230 |
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | III | 309 |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | III | 313 |
| 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | II | 237 |
| 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | II | 247 |
| 287 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | II | 251 |
| 288 | ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව | II | 255 |
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | II | 262 |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | III | 282 |
| 291 | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | III | 317 |
| 292 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | II | 266 |
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | III | 226 |
| 294 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | III | 321 |
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව | II | 112 |
| 296 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | I | 260 |
| 297 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | II | 116 |
| 298 | මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | II | 118 |
| 299 | ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | II | 120 |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | II | 122 |
| 301 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමූපකාර සමිති ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්) | II | 126 |
| 302 | සමූපකාර සේවක කොමිෂන් සභාව | II | 130 |
| 303 | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | III | 261 |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | I | 324 |
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | II | 174 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | II | 183 |
| 308 | තැපැල් දෙපාර්තමේන්තුව | II | 68 |
| 309 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | II | 332 |
| 310 | රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව | II | 338 |
| 311 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | II | 187 |
| 312 | බස්නාහිර පළාත් සභාව | III | 175 |
| 313 | මධ්‍යම පළාත් සභාව | III | 178 |

| | | | |
|---|---|---|---|
| 314 | දකුණු පළාත් සභාව | III | 181 |
| 315 | උතුරු පළාත් සභාව | III | 184 |
| 316 | වයඹ පළාත් සභාව | III | 188 |
| 317 | උතුරු මැද පළාත් සභාව | III | 191 |
| 318 | ඌව පළාත් සභාව | III | 194 |
| 319 | සබරගමුව පළාත් සභාව | III | 197 |
| 320 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | III | 419 |
| 321 | නැගෙනහිර පළාත් සභාව | III | 200 |
| 322 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | III | 325 |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | I | 264 |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | I | 266 |
| 325 | ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | I | 328 |
| 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | I | 395 |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | II | 274 |
| 328 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | III | 453 |
| 329 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | I | 269 |
| 331 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | II | 374 |
| 332 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | II | 342 |
| 333 | කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | I | 273 |
| 335 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | II | 446 |
| 336 | වෙළඳ නාවික ලේකම් කාර්යාලය | III | 371 |
| 337 | කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව | II | 278 |
| 338 | රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය | I | 275 |

## 2. 2026 අයවැය ඇස්තමේන්තු පිළිබඳ හැඳින්වීමේ සටහන

2026 වසර සඳහා වන වියදම් ඇස්තමේන්තු ඇතුළත් විසර්ජන පනත් කෙටුම්පත 2025 සැප්තැම්බර් මස 26 වැනි දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. අයවැය යෝජනා ඇතුළත් කිරීම උදෙසා වන සංශෝධන ඉදිරිපත් කිරීමෙන් පසු පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් 2025 දෙසැම්බර් මස 05 වන දින 2025 අංක 23 දරන විසර්ජන පනත ලෙස සම්මත කරන ලදී. මෙම අයවැය ඇස්තමේන්තු මඟින්, 2025 අංක 23 දරන විසර්ජන පනතේ සාරාංශගතව ඇතුළත් කරන ලද වියදම් ඇස්තමේන්තු සහ 2026 වර්ෂයේ දී රැස් කිරීමට ඇස්තමේන්තු කර ඇති ආදායම්, සම්මත වියදම් සහ ආදායම් කේතවලට අනුකූලව, ව්‍යුහගත ආකාරයෙන් විස්තරාත්මක පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරනු ලැබේ. විසර්ජන පනත උපලේඛන 3කින් සමන්විත වන අතර, ඒ ඒ උපලේඛන යටතේ වන ඇස්තමේන්තුවල සාරාංශයක් පහත දක්වා ඇත.

| | | | | |
|---|---|---|---|---|
| පළමුවන උපලේඛනය | - | විසර්ජන පනතෙන් බලාත්මක වන ආණ්ඩුවේ පොදු සේවා සඳහා වන වියදම් වැඩසටහන් අනුව දක්වයි | - | රු. 4,434,356,468,000 |
| දෙවන උපලේඛනය | - | නීතිය මගින් බලය ලැබී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු රජයේ වියදම් දක්වයි | - | රු. 4,545,643,532,000 |
| තෙවන උපලේඛනය | - | අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් වන වියදම් දක්වයි | - | රු. 10,000,000,000 |

මෙම විස්තරාත්මක අයවැය ඇස්තමේන්තු ප්‍රකාශනය, 1992 මුදල් රෙගුලාසිවල සඳහන් ආකෘතියට අනුගතව සකස්කර ඇති අතර ඒවා 2026 විසර්ජන පනතෙහි පරිශිෂ්ඨයක් ලෙස ඉදිරිපත් කෙරේ. විසර්ජන පනතෙහි සාරාංශගතව ඉදිරිපත් කර ඇති වියදම් ඇස්තමේන්තු, සම්මත ආදායම් සහ වියදම් කේත යටතේ ව්‍යුහගතකර, සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ලෙසින් මෙම විස්තරාත්මක ඇස්තමේන්තු මගින් දක්වා ඇත.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 19 හා 20 වන වගන්ති අනුව විසර්ජන පනතට අමතරව වාර්ෂික ආදායම් හා වියදම් පිළිබඳ විස්තරාත්මක ඇස්තමේන්තු ද නියම කරනු ලබන ආකෘතිවලට අනුකූලව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව දැක්වෙන බැවින් එම අවශ්‍යතාවයට අනුව මෙම ප්‍රකාශය සකස් කර ඇති අතර එය පහත පරිදි ව්‍යුහගත කර ඇත.

1. ආදායම් ඇස්තමේන්තු
2. වියදම් ඇස්තමේන්තු

### ආදායම් ඇස්තමේන්තු

බදු ආදායම්, බදු නොවන ආදායම්, පළාත් සභා විසින් එකතු කරන ලබන ආදායම් සහ ප්‍රදාන ද ඇතුළත්ව 2026 වසර සඳහා ඇස්තමේන්තුගත මුළු ආදායම රුපියල් බිලියන 5,466 ක් වේ. 2024 වසර සඳහා වන තාවකාලික (provisional) ආදායම, 2025 වසර සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තු, 2026 වසරේ ආදායම් ඇස්තමේන්තු සහ 2026 හා 2027 වසරයන්හි ආදායම් පුරෝකථන විස්තරාත්මකව 3.2.1, 3.2.2 සහ 3.2.3 යන වගුවල දැක්වේ.

එක් එක් ආදායම් සංකේතාංකයන්ට අදාළ අණපනත් හා රෙගුලාසි 3.1.1, 3.1.2 හා 3.1.3 යන වගුවල දක්වා ඇත. 2024 වසරේ එකතු කරන ලද තත්‍ය ආදායම සහ 2025 වසරේ පළමු මාස නවය සඳහා වන ආදායම් ප්‍රගතිය, නව ක්‍රියාමාර්ග තුළින් අපේක්ෂිත ආදායම් ඉහළ යාම, සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ වර්ධනයන් සහ ආදායම් ප්‍රගතිය පිළිබඳ කාර්ය මණ්ඩලයේ විනිශ්චය ඇතුළත් ප්‍රධාන සාධක මත 2026 වසර සඳහා වන ආදායම් ඇස්තමේන්තු පදනම් වී ඇත.

මෙම පුළුල් උපකල්පනයන් පහත පරිදි විස්තර කෙරේ;

- දේශීය හා විදේශීය යන දෙඅංශයේම සහායන්ගෙන් 2026 වසරේ දී සියයට 4 – 5 ක ආර්ථික වර්ධනයක් අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ අංශ තුනෙහිම එනම්, කාර්මික, සේවා සහ කෘෂිකාර්මික යන සියලුම අංශයන්හි පුළුල් වර්ධනයක් අපේක්ෂා කෙරේ.
- 2026 වසරේ මැද භාගය වන විට සාමාන්‍ය උද්ධමනය ක්‍රමයෙන් ඉලක්කගත අගය වන සියයට 5 වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- 2026 වසරේදී විරැකියා අනුපාතය සියයට 5 ට වඩා අඩු මට්ටමක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- 2026 වසරේදී විදේශ විනිමය අනුපාතිකය ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- 2026 වසරේදී වාහන සඳහා ඇති ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් 2025 වසරට සාපේක්ෂව මෝටර් වාහන ආශ්‍රිත ආනයන බදු වල ආන්තික අඩුවීම.
- වඩා යහපත් වූ සාර්ව ආර්ථික කළමනාකරණයක් උදෙසා මූල්‍ය ප්‍රතිපත්තිය වැඩි දියුණු කිරීමට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීම.
- ඩිජිටල්කරණ ප්‍රයත්නයන් තුළින් දූෂණ අවදානම් අවම කිරීම සහ ආදායම් පරිපාලන උපාය මාර්ගවල කාර්යක්ෂමතාව ඉහළ නංවමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවෙහි ආදායම් එකතු කිරීම ශක්තිමත් කිරීම.
- තනි පුද්ගලයන් සඳහා අනිවාර්ය විද්‍යුත් ගොනු කිරීම (e-filing) හඳුන්වාදීම, බදු ආපසු ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම, සරල කළ එකතු කළ අගය මත බද්ද (SVAT) ඉවත් කිරීම, විකුණුම්පොල ගෙවීම් (Point of Sales) යන්ත්‍ර භාවිතය බලාත්මක කිරීම, විද්‍යුත් ඉන්වොයිසි (e-invoicing) පද්ධතියක් හඳුන්වා දීම සහ අවදානම් මත පදනම් වූ විගණන කාර්යක්ෂමතාව වැඩි කිරීම මඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු අනුකූලතාව ඉහළ නැංවීම.
- සූදු කර්මාන්තය නියාමනය කිරීමට සහ පාලනය කිරීමට සූදු නියාමන අධිකාරියක් (Gambling Regulatory Authority) ස්ථාපිත කිරීම හා එමඟින් ආදායම් එකතු කිරීම සහ සූදු කර්මාන්තයේ විනිවිදභාවය හා යහපාලනය සහතික කිරීම.

ආදායම් ඇස්තමේන්තු සම්බන්ධ උපකල්පන හා අවදානම් පිළිබඳ විස්තර 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2026 අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි දක්වා ඇත.

## 2. වියදම් ඇස්තමේන්තු

(අ). පොදු ඇස්තමේන්තු

විසර්ජන පනතෙහි පළමු උපලේඛනය යටතේ වන පොදු සේවාවන් සඳහා වන වාර්ෂික විසර්ජනයන්ගෙන් සහ දෙවන උපලේඛනය යටතේ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීති මඟින් බලය ලැබී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු රජයේ වියදම් සඳහා වන වාර්ෂික විසර්ජනයන්ගෙන්, පොදු ඇස්තමේන්තුව සමන්විත වේ.

( ආ). අත්තිකාරම් ගිණුම් කටයුතු

විසර්ජන පනතෙහි තුන්වන උපලේඛනය යටතේ දක්වා ඇති අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා නියම කර ඇති සීමාවන් මෙම කොටසට ඇතුළත් වේ. අත්තිකාරම් ගිණුම් කටයුතුවලින් ලබන ආදායම හා ඒ සඳහා වන වියදම අතර වෙනස, වාර්ෂිකව ඒකාබද්ධ අරමුදලින් දරන වියදම වේ.

### 2.1 රජයේ වියදම් ඇස්තමේන්තු සැකසීම

2026 වියදම් ඇස්තමේන්තු සැකසීම සඳහා වන මාර්ගෝපදේශ හා උපදෙස් 2025-06-30 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 02/2025 මගින් සුපුරුදු පරිදි නිකුත් කරන ලදී. 2026 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී එම

මාර්ගෝපදේශ අනුව එක් එක් වැය දරන ආයතන විසින් ඉදිරිපත් කරන ලද දළ ඇස්තමේන්තු පදනම් කර ගෙන ඇති අතර රජයේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයන් හා එම එකඟතාවයන් ද සැලකිල්ලට ගෙන සකස් කරන ලද සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව, ණය ගැනීමේ සීමාවන් සහ අපේක්ෂිත ආදායමට අනුකූලව, එසේ වැය දරන ආයතන විසින් සකස් කළ ඇස්තමේන්තු සඳහා ඇතැම් ගැළපීම් සිදු කර ඇත.

එසේම, 2026 අයවැය ඇස්තමේන්තු, 2026 - 2028 මධ්‍ය කාලීන වියදම් රාමුව අනුව සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරන පනතේ 15 (1) උප වගන්තියෙහි දැක්වෙන රජයේ ප්‍රාථමික වියදම් සීමාව, එනම්, 2026 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත නාමික දළ දේශීය නිෂ්පාදිතයෙන් 13% ක ප්‍රතිශතය, නොඉක්මවන පරිදි සකස් කර ඇත.

2026 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී, රජයේ ව්‍යවස්ථාපිත වගකීම් මෙන්ම වැටුප්, විශ්‍රාම වැටුප්, බදු කුලී සහ පළාත්පාලන ආයතන බදු, උපයෝගීතා සේවා සඳහා ගෙවීම්, සුභසාධන වියදම් සහ වෙනත් මාරු කිරීම් ආදී අභිමතානුසාරී නොවන රජයේ වියදම් සඳහා අවශ්‍ය සම්පූර්ණ අරමුදල් සැලසෙන බව තහවුරු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිමා වීමට ආසන්න, ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති තුළින් සමාජයට කඩිනම් ප්‍රතිලාභ ලබා දිය හැකි බැවින්, එවැනි ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාවය ලබා දී ඇත. ග්‍රාමීය මට්ටමේ සංවර්ධනය ඉහළ නැංවීමට සහ නිෂ්පාදනාභිමුඛ ආර්ථිකයක් සඳහා වන කටයුතු වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන තහවුරු කර ඇත. මේ අතර ඩිජිටල් ප්‍රවේශය සඳහා වූ රජයේ ප්‍රයත්නය තව දුරටත් ශක්තිමත් කිරීම උදෙසා පවත්නා පරිගණක පද්ධති/මෘදුකාංග භාවිතයන් සහ අදාළ උපාංග යාවත්කාලීන කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබේ. එමෙන්ම, යටිතල පහසුකම් සහ වෙනත් වත්කම්වල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි අරමුදල් වෙන් කර දී තිබේ.

## 2.2 වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

නිශ්චිත අමාත්‍යාංශයක් යටතට නොගැනෙන විශේෂ වියදම් ඒකක හැර ඇස්තමේන්තුගත සියලුම රජයේ වියදම්, කැබිනට් අමාත්‍යාංශ යටතට ගොනුකර ඉදිරිපත් කරනු ලැබේ.

2026 වසරේ ඇස්තමේන්තු ගත වියදමට අමතරව, 2024 වර්ෂයේ සත්‍ය වියදම සහ 2025-09-30 දිනට 2025 වර්ෂයේ ප්‍රතිශෝධිත වියදම් ඇස්තමේන්තු ද, ඒ ඒ වැය ශීර්ෂය යටතේ මෙම ප්‍රකාශනය මගින් ඉදිරිපත් කරනු ලැබේ. 2025 වර්ෂයේ ප්‍රතිශෝධිත වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී, වැය ශීර්ෂ අංක 240 යටතේ "වාර්ෂික අයවැය සංචිත" ව්‍යාපෘතියෙන් ලබා දී ඇති පරිපූරක ප්‍රතිපාදන ද, 2025-09-30 දින දක්වා සිදු කරන ලද මු.රෙ. 66 මාරු කිරීම් ද, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද පරිපූරක ඇස්තමේන්තුවක් හා මුදල් අමාත්‍යවරයා විසින් අත්සන් කරන ලද විශේෂ නීති අධිකාරී බලපත්‍රයක් මඟින් අනුමත පරිපූරක ඇස්තමේන්තුවක් ද, පිළිබිඹු වන පරිදි, 2025 අයවැය ඇස්තමේන්තු සඳහා ගැළපීම් කර ඇත.

## 2.3 වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ

2026 වර්ෂය සඳහා වන විස්තරාත්මක වියදම් ඇස්තමේන්තු වෙළුම් 3 කින් ඉදිරිපත් කර ඇත.

| වෙළුම | ඇතුළත් වන අමාත්‍යාංශ |
|---|---|
| වෙළුම I | අංක 01 සිට 25 දක්වා වූ විශේෂ වියදම් ඒකක සහ වියදම් ශීර්ෂ අංක 101 සිට 110 දක්වා වන කැබිනට් අමාත්‍යාංශ සහ එම අමාත්‍යාංශ යටතේ වන දෙපාර්තමේන්තු |

| | |
|---|---|
| වෙළුම II | වැය ශීර්ෂ අංක 111 සිට 126 දක්වා වන කැබිනට් අමාත්‍යාංශ සහ එම අමාත්‍යාංශ යටතේ වන දෙපාර්තමේන්තු |
| වෙළුම III | වැය ශීර්ෂ අංක 130 සිට 196 දක්වා වන කැබිනට් අමාත්‍යාංශ, එම අමාත්‍යාංශ යටතේ වන දෙපාර්තමේන්තු සහ වැය ශීර්ෂ අංක 312 සිට 319 දක්වා සහ 321 වැය ශීර්ෂ අංකය දරන පළාත් සභා |

පහත දැක්වෙන අනුපිළිවෙල යටතේ වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කරනු ලැබේ.

2.3.1 කැබිනට් අමාත්‍යාංශ මට්ටමෙන් සාරාංශගත විස්තර

I. අංක 2412/08 දරන 2024.11.25 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් පිහිටුවන ලද සහ අංක 2458/65 දරන 2025-10-18 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් සංශෝධනය වූ අමාත්‍යාංශ ව්‍යුහය යටතේ සෑම කැබිනට් අමාත්‍යාංශයක්ම සහ එම අමාත්‍යාංශවල විෂයපථයට අයත්වන දෙපාර්තමේන්තු සහ ආයතන යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රධාන කාර්යයන්

II. වැය විෂයයන් අනුව සෑම අමාත්‍යාංශයකම වියදම් සාරාංශ හා ඒවායේ මූල්‍යකරණ මූලාශ්‍ර

III. වැය ශීර්ෂ හා වැඩසටහන් අනුව සෑම අමාත්‍යාංශයකම වියදම් සාරාංශය

2.3.2 අදාළ කැබිනට් අමාත්‍යාංශ යටතේ වන සෑම වැය ශීර්ෂයකටම වෙන වෙනම දැක්වෙන පරිදි විස්තරාත්මක වියදම් විස්තර

I. ඒ ඒ වැය ශීර්ෂය යටතේ වැය විෂය කාණ්ඩ/වැය විෂයයන් අනුව ඒ ඒ වැය ශීර්ෂයන්හි වියදම, ඊට අදාල මූල්‍යකරණ විස්තර හා කාර්ය මණ්ඩල සාරාංශය

II. ඒ ඒ ව්‍යාපෘතිවල වැය විෂයයන් අනුව වියදම සහ එහි මූල්‍යකරණය

## 2.4 වියදම් කාණ්ඩකරණයට අදාළ කාණ්ඩ මට්ටම්

### (අ) වැය ශීර්ෂ

එක් එක් වැය දරන ආයතන සඳහා වන වැය ශීර්ෂ පහත සඳහන් පරිදි නිශ්චිත ලෙස අංකනය කර ඇත.

(I) විශේෂ වියදම් ඒකක - නිශ්චිත අමාත්‍යාංශයක් යටතේ වර්ගීකරණය නොකළ දෙපාර්තමේන්තු, ආයතන සහ කොමිෂන් සභා යනාදිය සඳහා ශීර්ෂ අංක 1 සිට 25 දක්වා (3 ,12 , 14 සහ 15 අංක හැර) වැය ශීර්ෂ අංක වෙන්කර ඇත. මේ වන විට සමස්ත වශයෙන් එවැනි විශේෂ වියදම් ඒකක 21 කි.

(II) කැබිනට් අමාත්‍යාංශ සඳහා වැය ශිර්ෂ අංක 101 සිට 196 දක්වා වෙන්කර ඇත. එවැනි වැය ශීර්ෂවල එකතුව 25 කි.

(III) දෙපාර්තමේන්තු, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ඇතැම් නිශ්චිත ආයතන (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, ණය සහනදායක මණ්ඩලය වැනි) සඳහා වැය ශිර්ෂ අංක 201 සිට 338 දක්වා වෙන්කර ඇත. මෙම කාණ්ඩය යටතේ ලබා දී ඇති වැය ශීර්ෂවල එකතුව 134 කි.

ඒ අනුව, කැබිනට් අමාත්‍යාංශ 25ක්, දෙපාර්තමේන්තු සහ ආයතන 100ක්, පළාත් සභා 9ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක් සහ විශේෂ වියදම් ඒකක 21ක් ඇතුළත්ව මුළු වැය ශීර්ෂ සංඛ්‍යාව 180 කි.

විසර්ජන පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කරන අවස්ථාවේ දී පැවති අමාත්‍යාංශ ව්‍යුහය අංක 2458/65 හා 2025-10-18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධනය වූ බැවින්, 2025 අංක 23 දරන විසර්ජන පනත සම්මත වන අවස්ථාවේදී පැවති අමාත්‍යාංශ ව්‍යුහයට අදාළ වන පරිදි විසර්ජනයන් සිදු කිරීම සඳහා අවශ්‍ය ආනුෂංගික සංශෝධනයන් මෙම විස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල සිදු කර ඇත.

### (ආ) වියදම් වැඩසටහන්

ඇස්තමේන්තුගත වියදම පහත වැඩසටහන් දෙක යටතේ වර්ගීකරණය කර ඇත.

වැඩසටහන 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

වැඩසටහන 2 - සංවර්ධන ක්‍රියාකාරකම්

මෙහෙයුම් අරමුණු ස්වරූපයෙන් දරනු ලබන පුනරාවර්තන හා මූලධන වියදම් "වැඩසටහන 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්" යටතේ දක්වා ඇති අතර සංවර්ධනමය ස්වරූපයේ වියදම්, "වැඩසටහන 2 - සංවර්ධන ක්‍රියාකාරකම්" යටතේ දක්වා ඇත.

වැඩසටහන් අනුව වියදම් සාරාංශය 4.2 වගුවෙහි දැක්වේ.

### (ඇ) ව්‍යාපෘතිය / උප ව්‍යාපෘතිය

ව්‍යාපෘතියක් යනු යම්කිසි කාර්යයක් හෝ එක හා සමාන කාර්යයන් සමූහයකින් සමන්විත වැය ඒකකයකි. ඉහත සඳහන් වූ "වැඩසටහනක්" ව්‍යාපෘති ගණනාවකින් සමන්විත වේ. ඇතැම් අවස්ථාවන්හි දී කිසියම් ව්‍යාපෘතියක් යටතේ වන විශේෂිත කාර්යයන්, උප ව්‍යාපෘති ලෙස තවදුරටත් බෙදා දක්වා ඇත.

### (ඈ) වැය විෂය කාණ්ඩය / වැය විෂය / වැය විෂය සංකේත අංකය/ වැය විෂය අයිතමය

ව්‍යාපෘති පිරිවැයක වෙන් කොට හඳුනා ගත හැකි වියදම් සංරචක, "වැය විෂය" යටතේ වර්ගීකරණය කර ඇත. එක සමාන ආකාරයේ වැය විෂයයන් කිහිපයක් "වැය විෂය කාණ්ඩයක්" ලෙස වර්ගීකරණය කෙරේ. එක් එක් වැය විෂය නිරූපණය කිරීම සඳහා ඉලක්කම් 4 කින් යුත් සංකේත අංකයක් ලබාදී ඇති අතර එය "වැය විෂය අංකය" ලෙස හඳුන්වයි. නිදසුන්: 1001 - වැටුප් හා වේතන.

මෙම ලේඛනයේ වියදම් වර්ගීකරණය කිරීම සඳහා වැය විෂය සංකේත අංක 62 ක් සහ කාණ්ඩ 15 ක් භාවිතා කෙරේ. මෙම සම්මත වැය විෂයයන් හා කාණ්ඩ 4.1 වගුවේ දක්වා ඇති අතර කාණ්ඩ හා වැය විෂයයන් අනුව වියදම් සාරාංශය 4.5 වගුවේ දැක්වේ.

වැය විෂය අයිතමය - යම් වැය විෂයක්/වැය විෂය සංකේත අංකයන් යටතේ දැක්වෙන වියදම්, තවදුරටත් කොටස් කීපයකට බෙදා වෙන්කර දැක්වීමේදී, වැය විෂයය අංකයන් යටතේ වැය විෂයය අයිතම කීපයක් දැක්වීම සිදුවේ.

### (ඉ) මූල්‍යකරණ විස්තර

ගිණුම්කරණ කාර්යය සඳහා එක් එක් ව්‍යාපෘතිවල මූල්‍යකරණ මූලාශ්‍ර පහත මූල්‍යකරණ සංකේත අංක යටතේ වර්ගීකරණය කර ඇත.

| දේශීය | විදේශීය |
|---|---|
| 11. දේශීය අරමුදල් | 12. විදේශ ණය |
| 17. විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය | 13. විදේශ ප්‍රදාන |
| 18. විදේශීය මූල්‍යනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය | 14. ප්‍රතිපූරණය කරනු ලබන විදේශ ණය |
| 21. විශේෂ නීති සේවා | 15. ප්‍රතිපූරණය කරනු ලබන විදේශ ප්‍රදාන |
| | 16. ප්‍රතිපාර්ශවීය අරමුදල් |

සමස්ත වියදමෙහි මූල්‍යකරණ මූලාශ්‍ර 4.3 වගුව මගින් දක්වා ඇත. විදේශීය ණය පිළිබඳ වැඩිදුර තොරතුරු 2024 අංක 44 දරන "රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ" 20 (2) උප වගන්තියෙහි (ඈ) හි විධිවිධාන අනුව, පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීමට නියමිත මධ්‍ය කාලීන ණය කළමනාකරණ ක්‍රමෝපාය සහ වාර්ෂික ණය ලබාගැනීමේ සැලැස්මෙහි අඩංගු වනු ඇත.

### (ඊ) අත්තිකාරම් ගිණුම්

මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන අත්තිකාරම් මත පදනම්ව, රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පවත්වාගෙන යනු ලබන නිශ්චිත කාර්යයන් (උදා : රජයේ නිලධාරීන්ට ණය ලබාදීම, ගබඩා කළමනාකරණය උදෙසා අත්තිකාරම් ලබා දීම, වාණිජමය ස්වභාවයකින් යුත් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වන නිෂ්පාදන හා වෙළෙඳාම උදෙසා අත්තිකාරම් ලබා දීම ආදිය) අත්තිකාරම් ගිණුම් කටයුතු ලෙස නම් කරයි. එම අත්තිකාරම් ගිණුම් කටයුතුවලට සම්බන්ධ ලැබීම්වලට අදාළ අවම සීමාවන් සහ වියදම්වල උපරිම සීමාවන්, හර ශේෂයයන් හා වගකීම් මෙම ලේඛනය අවසානයේ 5.1 වගුව යටතේ දක්වා ඇත.

### (එ) සේවා නියුක්ති විස්තරය

මෙම ඇස්තමේන්තුවේ සේවක වර්ගීකරණය, 2006 අප්‍රේල් මස 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ II ඇමුණුම පදනම් කරගෙන සකස් කර ඇත. ඒ අනුව, එක් එක් වියදම් ශීර්ෂය යටතේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | | |
|---|---|---|
| අ | - | ජ්‍යෙෂ්ඨ මට්ටම |
| ආ | - | තෘතීය මට්ටම |
| ඇ | - | ද්විතීය මට්ටම |
| ඈ | - | ප්‍රාථමික මට්ටම |

## 2.5 කළමනාකරණයේ වගකීම

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වශයෙන් භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව, ස්වකීය අමාත්‍යාංශ යටතේ වන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම, මුදල් අමාත්‍යවරයා විසින් කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ට පවරා ඇත.

මු.රෙ. 125 (1) (අ) විධිවිධාන පරිදි භාණ්ඩාගාරය විසින් වෙනත් වැඩපිළිවෙළක් යොදා දුන්නේ නම් මිස, එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලුම මුදල් කටයුතු පිළිබඳව ගණන් දීමේ නිළධාරියා වන්නේ ය. මු.රෙ. 125 (1) (ආ) අනුව සෑම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරයෙක්ම තම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා වීමට අමතරව, සිය අමාත්‍යාංශ කාර්යාල සඳහා ද ගණන් දීමේ නිළධාරියා ද වේ. එහිදී කැබිනට් අමාත්‍යාංශයේ ලේකම්වරයා අදාළ අමාත්‍යවරයාට අයත් සම්පූර්ණ විෂයපථය, එනම්, අමාත්‍යාංශ කාර්යාලය, අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා ද ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා ද වේ.

එමෙන්ම, මුදල් රෙගුලාසි 124 (2) අනුව මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ලෙස පත්කරනු ලබන ලේකම්වරුන්, ස්වකීය අමාත්‍යාංශය යටතේ ඇති සෑම වියදම් ශිර්ෂයක් යටතේ ම සිදුකරනු ලබන වියදම් පිළිබඳව වගවිය යුතු වේ. ඒ අනුව, මෙම ඇස්තමේන්තුවල සඳහන් ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සහ මෙම ඇස්තමේන්තු මගින් වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන භාවිතා කරමින් සිදුකරනු ලබන වියදම් පිළිබඳව ද කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන් වගකිව යුතු වේ.

## 3. "වාර්ෂික අයවැය සංචිත" ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන සැලසීම

විසර්ජන පනතෙහි 6 (1) උප වගන්තියෙහි විධිවිධාන පරිදි උපයෝජනය කළ හැකිවන සේ යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වන "වාර්ෂික අයවැය සංචිත" ව්‍යාපෘතිය, එනම්, වැය ශීර්ෂ - 240, වැඩසටහන - 2, ව්‍යාපෘතිය - 2 යටතේ පවතින ප්‍රතිපාදනයන් ලෙස ඇතුළත් කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ලබාදෙන පරිපූරක ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ දී, ඒ ඒ වියදම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි, චක්‍රලේඛ හා අණපනත් යටතේ බලපවත්නා වූ විධිවිධාන තවදුරටත් අනුගමනය කිරීමට අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් හා අදාළ වන අනෙකුත් නිලධාරීන් වගකීමෙන් බැඳි සිටී.

### 3.1 "වාර්ෂික අයවැය සංචිත" ව්‍යාපෘතිය මගින් ප්‍රතිපාදන සැලසීම සඳහා වන මාර්ගෝපදේශ

පරිපූරක ප්‍රතිපාදන සැලසීම, හදිසි, හා අනපේක්ෂිත හා අත්‍යවශ්‍ය කරුණුවලට සීමා වනු ඇත. 2026 වර්ෂයට අදාළ විසර්ජන පනතෙහි 6 (1) උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට පහත දැක්වෙන කාර්යයන් සඳහා පමණක් පරිපූරක ප්‍රතිපාදන සලසා දෙනු ලැබේ.

i. ස්වභාවික ආපදා, අධිවසංගත තත්ත්ව හා ජාතික ආරක්ෂාව වැනි හදිසි තත්ත්වයන්හි දී දැරිය යුතු අවිනිශ්චිත වියදම් සඳහා ප්‍රතිපාදන

ii. අයවැය සකස් කිරීමට පාදක වූ උපකල්පන වෙනස්වීම නිසා දැරීමට සිදුවන අතිරේක වියදම් හා වගකීම් සඳහා වූ ප්‍රතිපාදන

iii. හානිවීම්, කපාහැරීම් වැනි වියදම් වාර්තා කිරීම සඳහා වූ ප්‍රතිපාදන

iv. සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ඌණතා පියවීම හෝ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර මූල්‍යනය හා අනෙකුත් වියදම් සඳහා වන අරමුදල් පියවීම සඳහා ප්‍රතිපාදන

v. රජය එක් පාර්ශවයක් වන ගිවිසුමක් යටතේ හෝ අධිකරණ නියෝගයක් මගින් ඉටුකිරීමට සිදුවන ඕනෑම බැඳීමක් නිරවුල් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සහ රජයේ ඇපවීම් යටතේ ඉටුකළ යුතු බැඳීම් අසම්භාව්‍ය බැරකම් උපලබ්ධිවීම හේතුවෙන් ඇතිවන වියදම් පියවීම සඳහා ප්‍රතිපාදන

vi. පසුබෑමට ලක්ව ඇති රාජ්‍ය ව්‍යාපාරවල හදිසි වගකීම හා එම ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන

vii. රාජ්‍ය සේවා වැටුප් හා ආශ්‍රිත ගෙවීම්වල ඇතිවන ඌණතාවයන් සඳහා ප්‍රතිපාදන

viii. රජයේ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය හේතුවෙන් අත්හිටුවා ඇති, විදේශ මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යලි සක්‍රීය කිරීමේදී අවශ්‍ය ප්‍රතිපාදන

ix. නිශ්චිත මුදල පැහැදිලි නොවීම හෝ මූල්‍ය අවශ්‍යතාව පිළිබඳව ඇතිවන ව්‍යාකූලතා යන කරුණු හේතුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදු නොකරනු ලබන අවස්ථාවලදී වියදම් දැරීම සඳහා වූ ප්‍රතිපාදන

x. 2025 වර්ෂයට අදාළ වූ අක්මුදල් නොලැබීම මත හෝ වෙනයම් සාධාරණ හේතුවක් මත නිරවුල් කිරීමට නොහැකි වූ බිල්පත් පියවීම සඳහා ප්‍රතිපාදන

xi. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන

විසර්ජන පනතෙහි 6 (1) වැනි උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, අදාළ වියදම් ඒකක විසින් සපයනු ලබන කරුණු ඉදිරිපත් කිරීම් / සාධාරණීකරණය කිරීම් මත පිහිටා අදාළ වියදම් ඒකකයන්ට පරිපූරක ප්‍රතිපාදන සළසා දෙනු ලැබේ. අදාළ මුදල් රෙගුලාසි සහ අනුමත විධිවිධානවලට යටත්ව, එබඳු අරමුදල් භාවිතය පිළිබඳ වගකීමට බැඳි සිටින ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින්, අනෙකුත් අදාළ ආයතන හා සාකච්ඡා කිරීමෙන් අනතුරුව පරිපූරක ප්‍රතිපාදන ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු වේ. ඉල්ලීම් කිරීමේ ප්‍රතිපාදන අවශ්‍යතාවය පැන නැගී ඇත්තේ ඉහත කවර කරුණක් හේතුවෙන්ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

විසර්ජන පනතෙහි 6 (1) වැනි වගන්තියෙහි සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි 25(4) අනු වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, මෙසේ මාරු කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය සහ එවැනි මාරු කිරීමක් සිදු කිරීමට හේතුව දැක්වෙන වාර්තාවක්, එම ප්‍රතිපාදනය මාරු කළ දින සිට මාස දෙකක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. ඊට අමතරව, මෙම ප්‍රතිපාදන මගින් සිදු කරන ලද සියලුම මාරු කිරීම් පිළිබඳ විස්තර එසේ මාරු කිරීමට හේතු සහිතව, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 51 වන වගන්තියේ විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත, ආණ්ඩුවේ මූල්‍ය කාර්යසාධනයට අදාළ වාර්තාවන්හි ඇතුළත් කිරීමට ද කටයුතු කරනු ඇත.

### 3.2 වියදම් යෝජනාවලට අදාළ ප්‍රතිපාදන

අයවැය කතාව මඟින් ප්‍රකාශයට පත් කරන ලද වියදම් යෝජනාවලට අදාළ ප්‍රතිපාදන අදාළ රේඛීය අමාත්‍යාංශවල ඇස්තමේන්තු යටතේ ඇතුළත් කර ඇත. වියදම් යෝජනා සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන නිසි ලෙස උපයෝජනය කිරීම සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ අදාළ ගණන්දීමේ නිලධාරීන් සම්පූර්ණයෙන්ම වගකීමෙන් බැඳී සිටී. ඇතැම් වියදම් යෝජනාවලට අදාළ ප්‍රතිපාදන, එනම්, රජයේ ආයතනවලට හා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය වාහන හා යන්ත්‍ර සූත්‍ර ලබා දීම (වියදම් යෝජනා අංක 01), රජයේ ආයතනවල ඩිජිටල් ප්‍රවේශය ඉහළ නැංවීම (වියදම් යෝජනා අංක 02), රජයේ සේවකයින්ට බැංකු මඟින් ලබා දෙනු ලැබූ දේපල ණය යෝජනා ක්‍රමය නැවත ක්‍රියාත්මක කිරීම (වියදම් යෝජනා අංක 04), ගුරු දුෂ්කර දීමනාව හා විදුහල්පති දීමනාව වැඩි කිරීම (වියදම් යෝජනා අංක 05), අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල ගේට්ටුකරුවන්ගේ දීමනාව වැඩි කිරීම (වියදම් යෝජනා අංක 06), විශේෂ අවශ්‍යතා සහිත/ අඛාධිත, තරුණ/තරුණියන් පුද්ගලික අංශයේ රැකියාවල නියුක්ත කරවීම දිරි ගැන්වීම (වියදම් යෝජනා අංක 12), ආබාධිත සහ විශේෂිත අවශ්‍යතා ඇති තැනැත්තන් හට පොදු ස්ථාන වෙත ප්‍රවේශ පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැලසීම (වියදම් යෝජනා අංක 13), තැලිසීමියා රෝගීන් සඳහා සහන සැලසීම (වියදම් යෝජනා අංක 15), ඔටිසම් ඇතුළු ආබාධිත දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම (වියදම් යෝජනා අංක 16), Cashless Economy ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ ආයතන වෙත පහසුකම් සැලසීම (වියදම් යෝජනා අංක 18), ආයතනගතව සිට නැවත සමාජගත වීම සහ ළමා රැකවරණය වෙනුවෙන් නිවාස ආධාර (වියදම් යෝජනා අංක 31), ආරෝග්‍යා මධ්‍යස්ථාන පිහිටුවීම (වියදම් යෝජනා අංක 42), දෙණියාය සහ දඹුල්ල රෝහල් සුදුසු ස්ථානවල නැවත ස්ථානගත කිරීම (වියදම් යෝජනා අංක 43), මත්ද්‍රව්‍ය උවදුර වැළැක්වීම සඳහා රටම එකට ජාතික මෙහෙයුම (වියදම් යෝජනා අංක 45), රත්නපුර නගර සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කිරීම (රජයේ නිල නිවාස ඉදිකිරීම) (වියදම් යෝජනා අංක 48), අම්පාර හා මොණරාගල නගර ශාලා ඉදිකිරීම (වියදම් යෝජනා අංක 50), ඉදිකිරීම නවතා ඇති නින්දවූර් සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් නිමකිරීම (වියදම් යෝජනා අංක 54), රිදී ආර්ථිකය - ජෙයෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ආයෝජනය (වියදම් යෝජනා අංක 55), දේශීය ගුවන් තොටුපළවල් සංවර්ධනය (වියදම් යෝජනා අංක 58), මාතර, නිල්වලා ගඟ ආශ්‍රිත ගංවතුර හා ලවණ ගලා ඒම පාලනය (වියදම් යෝජනා අංක 61) සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන "අයවැය යෝජනා" ව්‍යාපෘතිය, එනම්, වැය ශීර්ෂ - 240, වැඩසටහන - 2, ව්‍යාපෘතිය - 03 යටතේ වෙන් කර ඇත. මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන යථා කාලයේ දී අදාළ වියදම් ශීර්ෂ සඳහා ලබා දෙනු ඇත.

අයවැය ඇස්තමේන්තු මූලික වශයෙන් පිළියෙළ කරනුයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ ගිණුම්කරණ පරමාර්ථයන් උදෙසා වේ. මෙම ඇස්තමේන්තු, මහජනයාට පහසුවෙන් තේරුම්ගත හැකිවන පරිදි අයවැය ඇස්තමේන්තුවල සාරාංශගත කරන ලද ජනතා හිතවාදී අනුවාදයක්, "පුරවැසි අයවැය ලේඛනය" ලෙසින්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන පරිදි පාර්ලිමේන්තුවට වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය දෘෂ්‍යාබාධිත පුද්ගලයන්ට ද පරිශීලනය කිරීමට හැකිවන පරිදි "Unicode" අක්ෂර භාවිතා කර සකස්කර තිබේ. එය මුදල් අමාත්‍යාංශ වෙබ් පිටුව (www.treasury.gov.lk) මඟින් බාගත කර ගැනීම සිදුකළ හැක.

2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ වෙනත් නීති මගින් බලය ලැබී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු රජයේ වියදම්

| ශීර්ෂ අංකය | වියදම් දරණ ඒකකය/අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව / ආයතනය | වියදම් සඳහා බලය දෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ නීතියේ ප්‍රතිපාදනය | පුනරාවර්තන වියදම රු. | මූලධන වියදම රු. | මුළු වියදම රු. |
|---|---|---|---|---|---|
| 1 | අතිගරු ජනාධිපති | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 වන ව්‍යවස්ථාව | 7,020 | - | 7,020 |
| 4 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108 වන ව්‍යවස්ථාව | 132,000 | - | 132,000 |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IX වන පරිච්ඡේදය | 10,260 | - | 10,260 |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XV අ වන පරිච්ඡේදය | 3,850 | - | 3,850 |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIII අ වන පරිච්ඡේදය | 8,100 | - | 8,100 |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව | 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත | 21,600 | - | 21,600 |
| 16 | පාර්ලිමේන්තුව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව | 2,600 | - | 2,600 |
| 20 | මැතිවරණ කොමිෂන් සභාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව | 6,000 | - | 6,000 |
| 21 | ජාතික විගණන කාර්යාලය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව | 2,200 | - | 2,200 |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව | 1,700 | - | 1,700 |
| 23 | විගණන සේවා කොමිෂන් සභාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 අ වන ව්‍යවස්ථාව | 5,200 | - | 5,200 |
| 24 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 ආ වන ව්‍යවස්ථාව | 6,000 | - | 6,000 |
| 111 | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | වෛද්‍ය ආඥාපනත (105 වන අධිකාරය) | 2 | - | 2 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 38 වගන්තිය, (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත, 2018 අංක 8 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත 6 (1) වගන්තිය | 2,615,300,000 | 1,852,137,000 | 4,467,437,000 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | (431 වන අධිකාරය වූ), වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනත, 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත, 1970 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත, (432 වන අධිකාරය වූ) පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත | 78,000,000 | - | 78,000,000 |
| | **එකතුව** | | **2,693,506,532** | **1,852,137,000** | **4,545,643,532** |

# ආදායම් ඇස්තමේන්තු

## 3.1.1 - ආදායම් වර්ගීකරණය - බදු ආදායම

| ආදායම් සංකේතය | විස්තරය | ව්‍යවස්ථාව/අධිකාරි බලය | ආදායම් ගණන් දීමේ නිලධාරි |
|---|---|---|---|
| **10.01** | **ජාත්‍යන්තර වෙළඳාම හා ගනුදෙනු සඳහා වූ බදු** | | |
| 10.01.01.00 | ආනයන බදු | - 1869 අංක 17 දරන රේගු අඥා පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.02.00 | අපනයන බදු | - 1869 අංක 17 දරන රේගු අඥා පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.03.00 | ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු | - 1969 අංක 1 දරන ආනයන අපනයන පාලන පනත | ආනයන හා අපනයන පාලක |
| 10.01.04.00 | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | - 2002 අංක 11 දරන මුදල් පනත /2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.05.00 | සෙස් බදු | | |
| 10.01.05.01 | ආනයන සෙස් බදු | - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.05.02 | අපනයන සෙස් බදු | - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත,<br>1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත,<br>1971 අංක 46 දරන පොල් සංවර්ධන අධිකාරි පනත,<br>1953 අංක 36 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.06.00 | මෝටර් රථ වාහන අනුග්‍රාහක බද්ද | - 2006 අංක 11 දරන මුදල් පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.07.00 | ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද | - 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.08.00 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.01.99.00 | අනෙකුත් | - | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| **10.02** | **දේශීය භාණ්ඩ හා සේවා මත බදු** | | |
| **10.02.01.00** | **එකතු කළ අගය මත බද්ද** | - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.02.01.01 | මූල්‍ය සේවාවන් | | |
| 10.02.01.02 | අනෙකුත් සේවාවන් | | |
| 10.02.01.03 | නිෂ්පාදන | | |
| 10.02.01.04 | ආනයන | | |
| **10.02.02.00** | **භාණ්ඩ හා සේවා බද්ද** | - 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.02.02.01 | සේවාවන් | | |
| 10.02.02.02 | නිෂ්පාදන | | |
| 10.02.02.03 | ආනයන | | |
| **10.02.03.00** | **ජාතික ආරක්ෂක බද්ද** | - 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.02.03.01 | සේවාවන් | | |
| 10.02.03.02 | නිෂ්පාදන | | |
| 10.02.03.03 | ආනයන | | |
| **10.02.04.00** | **සුරා බද්ද (අඥාපනත)** | - 1912 අංක 8 දරන සුරාබදු අඥාපනත | සුරාබදු කොමසාරිස් ජනරාල් |
| 10.02.04.01 | මත්පැන් | | |
| **10.02.05.00** | **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු** | - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත | නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අධ්‍යක්ෂ ජනරාල් |
| 10.02.05.01 | සිගරට් | | |
| 10.02.05.02 | මත්පැන් | | |
| 10.02.05.03 | ඛනිජ තෙල් නිෂ්පාදන | | |
| 10.02.05.04 | මෝටර් රථ වාහන | | |
| 10.02.05.05 | ලොතරැයි | | |
| 10.02.05.99 | අනෙකුත් | | |
| **10.02.06.00** | **දුම්කොළ බද්ද** | - 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත | සුරාබදු කොමසාරිස් ජනරාල් |
| **10.02.07.00** | **මුද්දර ගාස්තු** | - 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.02.08.00** | **හර බද්ද** | - 2002 අංක 16 දරන හර බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.02.09.00** | **පිරිවැටුම් බද්ද** | - 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.02.10.00** | **සමාජ වගකීම් බද්ද** | - 2005 අංක 5 දරන මුදල් පනත | අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති<br>(අදාල දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට වාර්තා කළ යුතයි) |
| **10.02.11.00** | **විදුලි සංදේශ බද්ද** | - 2011 අංක 21 දරන විදුලිසංදේශ බදු පනත | විදුලි සංදේශ නියාමන කොමිසම අයත් අමාත්‍යාංශයේ |
| **10.02.12.00** | **ජාතිය ගොඩනැගීමේ බද්ද** | - 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.02.12.01 | සේවාවන් | | |
| 10.02.12.02 | නිෂ්පාදන | | |
| 10.02.12.03 | ආනයන | | |
| **10.02.13.00** | **වෙළිනාව්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද** | - 2006 අංක 11 දරන මුදල් පනත හා 2017.08.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය | ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් |
| **10.02.14.00** | **ජංගම දුරකථන සන්නිවේදන කුළුණු බද්ද** | - 2018 අංක 35 දරන මුදල් පනත | විදුලි සංදේශ නියාමන කොමිසම අයත් අමාත්‍යාංශයේ ලේකම් |
| **10.02.15.00** | **කෙටි වෙළඳ පණිවිඩ බද්ද** | 2018 අංක 35 දරන මුදල් පනත | විදුලි සංදේශ නියාමන කොමිසම අයත් අමාත්‍යාංශයේ ලේකම් |
| **10.02.16.00** | **සමාජ ආරක්ෂණ දායක අය බද්ද** | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.02.16.01 | සේවාවන් | | |
| 10.02.16.02 | නිෂ්පාදන | | |
| 10.02.16.03 | ආනයන | | |
| **10.03** | **බලපත්‍ර ගාස්තු හා වෙනත්** | | |
| **10.03.01.00** | **සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද** | - 1995 අංක 16 දරන මුදල් පනත | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් |
| **10.03.02.00** | **පැවරීම බද්ද** | - 1963 අංක 11 දරන මුදල් පනත | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| **10.03.03.00** | **ඔට්ටු හා සූදු බද්ද** | - 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් හා සූදු බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.03.04.00** | **කොටස් ගනුදෙනු බද්ද** | - 2005 අංක 5 දරන මුදල් පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.03.05.00** | **ඉදිකිරීමේ කර්මාන්ත ඇප සහතික වීමේ අරමුදල් බද්ද** | - 2005 අංක 5 දරන මුදල් පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.03.06.00** | **පරිසර සංරක්ෂණ බද්ද** | - 2008 අංක 26 දරන පරිසර සංරක්ෂණ බදු පනත | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **10.03.07.00** | **අනෙකුත් බලපත්‍ර ගාස්තු** | | |
| 10.03.07.01 | ඖෂධ, උපකරණ, විලවුන් හා ඖෂධ වෙළෙඳසැල් ලියාපදිංචි | - දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ, මූදල් රෙගුලාසි හෝ විශේෂිත රෙගුලාසි | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| 10.03.07.02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාල ලියාපදිංචි | - අදාල පනත්, දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ විශේෂිත රෙගුලාසි | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 10.03.07.03 | පෞද්ගලික දව ප්‍රවාහනය | - 1979 අංක 56 දරන වන අඥාපනත | වන සංරක්ෂක |
| 10.03.07.04 | මෝටර් රථ වාහන විකිණීම මත බදු | - 1951 අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහන පනත | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් |
| 10.03.07.05 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අදාල බලපත්‍ර ගාස්තු | - අදාල පනත්, දෙපාර්තමේන්තු චක්‍රලේඛ හෝ විශේෂිත රෙගුලාසි | ලේකම්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය |
| 10.03.07.06 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට අදාල බලපත්‍ර ගාස්තු | - 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත | ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් |
| 10.03.07.07 | තරු පශේ හෝටල්වල කාමර සඳහා බද්ද | - 2011 අංක 15 දරන මුදල් (සංශෝධන) පනත | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| 10.03.07.08 | සමාගම ලියාපදිංචි කිරීමේ බද්ද | - 2018 අංක 35 දරන මුදල් පනත | සමාගම් රෙජිස්ට්‍රාර් |
| 10.03.07.09 | කාබන් බද්ද | - 2018 අංක 35 දරන මුදල් පනත | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් |
| 10.03.07.10 | වාහන හිමිකම් බද්ද | - 2018 අංක 35 දරන මුදල් පනත | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 10.03.07.11 | ණය ආපසු ගෙවීමේ බද්ද | - 2018 අංක 35 දරන මුදල් පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.03.07.99 | අනෙකුත් | - දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ, මූදල් රෙගුලාසි හෝ විශේෂිත රෙගුලාසි | ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 10.03.08.00 | **නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු** | - 2013 අංක 13 දරන නොතාරිස් (සංශෝධන) පනත | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 10.03.09.00 | **විදේශිකයන්ට බදු දෙන ඉඩම් සඳහා වන බද්ද** | - 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.03.10.00 | **විගමන බද්ද** | 2015 අංක 10 දරන මුදල් පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.03.11.00 | **ප්‍රේෂණ ගාස්තු** | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| **10.04** | **ආදායම් හා ලාභ මත බදු** | | |
| **10.04.01.00** | **සංඝිතික බදු** | - 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.04.01.01 | ආදායම් බදු | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත | |
| 10.04.01.02 | ලාභාංශ බද්ද | | |
| 10.04.01.03 | ප්‍රේෂණ බද්ද | | |
| **10.04.02.00** | **සංඝිතික නොවන බදු** | - 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.04.02.01 | උපයන විට ගෙවීම් බද්ද | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත | |
| 10.04.02.99 | අනෙකුත් | | |
| **10.04.03.00** | **රඳවා ගැනීමේ බදු** | - 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.04.03.01 | පොළිය මත | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත | |
| 10.04.03.99 | ගාස්තු හා වෙනත් | | |
| **10.04.04.00** | **ආර්ථික සේවා ගාස්තු** | - 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.04.04.01 | දේශීය | | |
| 10.04.04.02 | ආනයන | | |
| 10.04.05.00 | ප්‍රාග්ධන ලාභ බද්ද | - 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 10.04.06.00 | ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 2021 අංක 18 දරන මුදල් පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |

## 3.1.2 - ආදායම් වර්ගීකරණය - බදු නොවන ආදායම

| ආදායම් සංකේතය | විස්තරය | ව්‍යවස්ථාව/අධිකාරි බලය | ආදායම් ගණන් දීමේ නිලධාරි |
|---|---|---|---|
| **20.01** | **දෙපාර්තමේන්තුමය ව්‍යවසායයන්ගෙන් ලැබෙන ආදායම්** | | |
| 20.01.01.00 | දුම්රිය | - 1902 අංක 9 දරන දුම්රිය අඥාපනත | දුම්රිය සාමාන්‍යාධිකාරි |
| 20.01.02.00 | තැපැල් | - 1908 අංක 11 දරන ලංකා තැපැල් කාර්යාල අඥාපනත | තැපැල්පති |
| 20.01.03.00 | ගබඩා අත්තිකාරම් (පුපුරණ ද්‍රව්‍ය) ගිණුම | - මුදල් රෙගුලාසි | නාවික හමුදාපති |
| 20.01.04.00 | බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම | - මුදල් රෙගුලාසි | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් |
| **20.02** | **රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම්** | | |
| **20.02.01.00** | **කුලී** | | |
| 20.02.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | - ආයතන සංග්‍රහය/ඉඩම් සංවර්ධන අඥාපනත | ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය (අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වාර්තා කළ යුතුයි.) |
| 20.02.01.02 | රජයේ කැලෑවලින් ලැබෙන ආදායම | - 1979 අංක 56 දරන වන අඥාපනත | වන සංරක්ෂක |
| 20.02.01.03 | ඉඩම් හා අනිකුත් බදු කුලී | - ඉඩම් සංවර්ධන අඥාපනත සහ රාජ්‍ය ඉඩම් අඥාපනත | ඉඩම් කොමසාරිස් |
| 20.02.01.04 | ප්‍රාදේශීය වතු සමාගම්වලින් ලැබෙන කල්බදු කුලී | - කල්බදු කුලී ගිවිසුම් | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් |
| 20.02.01.99 | අනෙකුත් කුලී | - අදාල දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා හෝ බදු කුලී ගිවිසුම් | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.02.02.00** | **පොළිය** | | |
| 20.02.02.01 | ණය දීම | - උප ණය ගිවිසුම් | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| 20.02.02.99 | අනෙකුත් | - අර්ථසාධක අරමුදල් පනත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.02.03.00** | **ලාභ** | - 1971 අංක 38 දරන මුදල් පනත | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් |
| **20.02.04.00** | **ලාභාංශ** | - 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ රජයට අයත් සමාගම් වල | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් |
| **20.02.05.00** | **රාජ්‍ය ව්‍යාපාර වල අතිරික්ත අරමුදල් මාරු කිරීම** | - අදාල දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් |
| **20.03** | **විකුණුම් හා ගාස්තු** | | |
| **20.03.01.00** | **දෙපාර්තමේන්තුමය විකිණීම්** | - මුදල් රෙගුලාසි හෝ අදාල දෙපාර්තමේන්තු චක්‍රලේඛ | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.03.02.00** | **පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්** | | |
| 20.03.02.01 | විගණන ගාස්තු | - 1971 අංක 38 දරන මුදල් පනත | විගණකාධිපති |
| 20.03.02.02 | ගුවන් නාවික ගාස්තු | - ගුවන් නාවික පනත (13 (2) වගන්තිය හා 24 වගන්තිය) | ලේකම්, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය |
| 20.03.02.03 | 1968 අංක 32 දරන පුද්ගලයන් ලිප. කිරීමේ පනත යටතේ ගාස්තු | - 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් |
| 20.03.02.04 | මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අදාල ගාස්තු | - දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ | මැනුම්පති |
| 20.03.02.05 | රජයේ මුද්‍රණාලයේ ලැබීම් | - අදාල දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා | රජයේ මුද්‍රණාලයාධිපති |
| 20.03.02.06 | වනසත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ අඥාපනත යටතේ ගාස්තු | - වනසත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ අඥාපනත | වනජීවි අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.07 | ගැනීම සම්බන්ධ ගාස්තු | - ආගමන හා විගමන පනත, පුරවැසි භාවය පනත | ආගමන හා විගමන පාලක |
| 20.03.02.08 | අපගමන බද්ද | - 2003 අංක 25 දරන මුදල් පනත | ලේකම්, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය |
| 20.03.02.09 | තක්සේරු දෙපාර්තමේන්තුවේ ගාස්තු | - ආයතන සංග්‍රහය | ප්‍රධාන තක්සේරුකරු |
| 20.03.02.10 | සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු | - 2007 අංක 7 දරන සමාගම් පනත | සමාගම් රෙජිස්ට්‍රාර් |
| 20.03.02.11 | සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් ලැබන නෛතික ගාස්තු | - අදාල දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා | නීතිපති |
| 20.03.02.12 | රාජ්‍ය කොන්ත්‍රාත් පනත යටතේ අයකරනු ලබන ගාස්තු | - 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත | සමාගම් රෙජිස්ට්‍රාර් |
| 20.03.02.13 | විභාග හා අනිකුත් ගාස්තු | - අදාල දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා | විභාග කොමසාරිස් ජනරාල් |
| 20.03.02.14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු හා | - 1951 අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහන පනත | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් |
| 20.03.02.15 | පැවරීමේදි අයකරනු ලබන ලියාපදිංචි කිරීමේ ගාස්තු | - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/(02)2013 | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් |
| 20.03.02.16 | ගුවන් යානා කුලී ආදායම් | - අදාල අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ හෝ විශේෂිත නීතිරීති | ගුවන් හමුදාපති |
| 20.03.02.17 | ඇඟළුම් සඳහා දේශීය විකුණුම් මත ගාස්තු | - ආයෝජන මණ්ඩලය / රේගු රෙගුලාසි | රේගු අධ්‍යක්ෂ ජනරාල් /ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ |
| 20.03.02.18 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාල ගාස්තු | - දෙපාර්තමේන්තමය චක්‍රලේඛ හෝ නියෝග | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.19 | උද්භිද උද්‍යාන ආදායම් | - 1973 අංක 32 දරන උද්භිද උද්‍යාන පනත හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ | ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.20 | ගිණුම් හා විගණන ප්‍රමිති සෙස් බද්ද | - 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.02.21 | ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට අදාල ගාස්තු | - අදාල දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ ගිවිසුම්ගත | ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් |
| 20.03.02.22 | වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයට අදාළ ගාස්තු | - 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත | වෙළඳ නාවික ලේකම් කාර්යාලය අයත් අමාත්‍යාංශයේ ලේකම් |
| 20.03.02.23 | කැසිනෝ බලපත්‍ර ගාස්තු | - 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| 20.03.02.99 | විවිධ | - අදාල දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත ව්‍යවස්ථා | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් (අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ට වාර්තා කළ යුතුයි.) |
| **20.03.03.00** | **දඩමුදල් හා රාජසන්තක කිරීම්** | | |
| 20.03.03.01 | දඩමුදල් හා රාජසන්තක කිරීම් - රේගුව | - රේගු අඥාපනත හෝ විශේෂිත නීතිරීති | රේගු අධ්‍යක්ෂ ජනරාල් |
| 20.03.03.02 | දඩමුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත් | - අදාල පනත් හෝ විශේෂිත රෙගුලාසි | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.03.04.00** | **රජයේ නිලධරීන්ට ලබා දෙන යතුරු පැදි සම්බන්ධ මූලික ගෙවීම** | - අයවැය චක්‍රලේඛ අංක 02/2014 | අයවැය අධ්‍යක්ෂ ජනරාල් |
| **20.03.05.00** | **භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය** | 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් අඥාපනත | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.03.06.00** | **එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් තුලින් ලද ආදායම** | - එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග ඇතිකරගන්නා අදාල අවබෝධතා | ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය |
| **20.03.07.00** | **රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන** | අමාත්‍ය මණ්ඩල තීරණ හා අදාළ ව්‍යවස්ථා | කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් |
| **20.03.08.00** | **ජල විදුලි බලය විකිණීමෙන් ලබන ආදායම** | විදුලි බලය මිලදී ගැනීම/ විකිණීම සඳහා විදුලිබල මණ්ඩලය සහ වාරිමාර්ග ව්‍යාපෘති අතර ඇතිකර ගනු ලබන ගිවිසුම් | මහවැලි අධිකාරිය අයත් අමාත්‍යාංශයේ ලේකම් |
| **20.03.09.00** | **සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් මගින් ලද ආදායම** | අමාත්‍ය මණ්ඩල තීරණ හා අදාළ ව්‍යවස්ථා | ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් |
| **20.03.99.00** | **අනිකුත් ලැබීම්** | - අදාල දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ හෝ මුදල් රෙගුලාසි හෝ නිශ්චිත | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් |
| **20.04** | **සමාජ රක්ෂණ දායක මුදල්** | - 1898 අංක 1 දරන "වැන්දඹු හා අනත්දරු" අඥාපනත<br>1953 අංක 44 දරන ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු පනත<br>1970 අංක 18 දරන සන්නාහ සන්නද්ධ හමුදා වැන්දඹු හා අනත්දරු පනත<br>1983 අංක 24 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් |
| 20.04.01.00 | මධ්‍යම රජය | | |
